**කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය**

# පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ්

# පුරප්පාඩු

පරන්තන් කෙමිකල්ස් රසායනික සමාගම රසායන ද්‍රව්‍ය අලෙවියෙහි සහ නිෂ්පාදනයෙහි නිරත රාජ්‍ය ආයතනයකි. සමාගමේ කාර්යයන් තවදුරටත් පුළුල් කිරීම සඳහා ආයතනයේ පහත පුරප්පාඩුවලට අයදුම්පත් කැඳවනු ලැබේ.

## තාක්ෂණ නිලධාරී තනතුර (JM 1-1)-තනතුරු 01

**තනතුරට අදාළ රාජකාරී**

1. රසායනික ද්‍රව්‍යවල තත්ත්වය උසස් කිරීම/තත්ත්වය සහතික කිරීම
2. පවත්නා නිෂ්පාදන සහ නව නිෂ්පාදන පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධනය කිරීම සිදු කිරීම
3. ක්‍රියාකාරී නිෂ්පාදන ක්‍රියාවලියක් සඳහා සහය ලබාදීම
4. ආරක්ෂිත උපක්‍රම වැඩිදියුණු කිරීම

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන්** : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් රසායන විද්‍යාව විෂය ඇතුළත් විද්‍යා උපාධියක් ලබා තිබීම

**පළපුරුද්ද** : සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් ලබා ඇති අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව ලබා දෙනු ලැබේ.

**සේවා ස්ථානය** : කළුතර ඒකකය, කෙසේ වුවත් අවශ්‍යතාව පරිදි දිවයිනේ ඕනෑම ස්ථානයක සේවයට බැඳී සිටිය යුතුයි.

**වැටුප් පරිමාණය** : මාසික වැටුප් පරිමාණය-JM 1-1

රු. 42,600-755 X 10-1,135 X 18-70,580

(2020.01.01 දින සිට බල පැවැත්වේ.)

**මූලික වැටුප** : රු.29,355/- සහ ගැලපුම් දීමනාව රු.5,275

(කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ 02/2016 අනුව)

කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව ගෙවනු ලබන රු. 7,800/- ක ජීවන වියදම් දීමනාව හිමිවේ.

## කළමනාකරණ සහකාර (ගිණුම්) (MA 1-2) තනතුරු 01

**තනතුරට අදාළ රාජකාරී** : උක්ත තනතුරට අදාළව ගිණුම් අංශයට සම්බන්ධ රාජකාරීවල නිරතවීම

**අධ්‍යාපන සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්** : අ.පො.ස. (සා.පෙ) විභාගයෙන් එක් වතාවකට නොවැඩි වාර ගණනක දී පහත සඳහන් විෂයයන් ද ඇතුළුව සම්මාන සාමාර්ථ 4 ක් ලබා තිබීම.

i. සිංහල/දමිල ii. ගණිතය iii. ඉංග්‍රීසි

සහ

අ.පො.ස (උසස් පෙළ) විභාගයෙන් සාමාර්ථ තුනක් ලබා තිබීම(සාමාන්‍ය දැනුම ප්‍රශ්න පත්‍රය හැර)

**පළපුරුද්ද** : ගිණුම් කටයුතු සම්බන්ධ සේවා පළපුරුද්ද සහ ගණකාධිකරණය ආශ්‍රිත පාඨමාලා හදාරා තිබීම විශේෂයෙන් සලකනු ලැබේ.

**සේවා ස්ථානය** : ප්‍රධාන කාර්යාලය, කොළඹ 13, කෙසේ වුවත් අවශ්‍යතාවය පරිදි දිවයිනේ ඕනෑම ස්ථානයක සේවයට බැඳී සිටිය යුතුය.

**වැටුප් පරිමාණය** : MA1-2-2016රු.[27,910-10X300-7X350-12X600-12X710-49,080]

(2020.01.01 දින සිට බල පැවැත්වේ)

**මූලික වැටුප**

රු. 19,234/- සහ ගැලපුම් දීමනාව රු. 6,984/-

(කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ 02/2016 අනුව)

කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව ගෙවනු ලබන රු. 7,800/- ක ජීවන වියදම් දීමනාව හිමිවේ.

**වයස (ඉහත තනතුරු දෙකම සඳහා)**

අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය(ඉහත තනතුරු දෙකම සඳහා)**

තරගකාරී ලිඛිත විභාගයක් සහ/ හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**අනෙකුත් පහසුකම් (ඉහත තනතුරු දෙකම සඳහා)**

ආයතනය මගින් ලබාදෙන සෞඛ්‍ය රක්ෂණ ආවරණය, පැමිණීමේ දිරි දීමනා සහ ප්‍රසාද දීමනා හිමිවනු ඇත.

ආයතනය මගින් 15% ක දායක මුදලක් සේවක අර්ථසාධක අරමුදලට බැර කරන අතර, සේවකයාගෙන් 10% ක මුදලක් බැර කරනු ලැබේ. සේවක භාරකාර අරමුදල සඳහා 3% ක් ආයතනය මගින් බැර කරනු ලැබේ.

අයදුම්කරුවන් විසින් පිළියෙල කරන ලද අයදුම්පත් අධ්‍යාපන සහතික හා සේවා පළපුරුද්ද තහවුරු කිරීමේ සහතික පත්‍රවල පිටපත් ද සහිතව ඥාති සබඳතාවක් නොමැති නිර්දේශකරුවන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංක සහිතව 2017.05.30 දිනට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය.

**නිසි බලධාරී,**
**පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ්,**
**100/25, ශ්‍රී රාමනාදන් මාවත, කොළඹ 13.**

**0112-324465**

www.paranthanchemicals.gov.lk